**වැලිගම ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**

-----------------------

## 01 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 15 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වටිනාකම රු.100,000 ක් වූ ඉඩම් 02 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණ අතර දෙනිපිටිය මාතෘ නිවාසය, මුදුගමුව මාතෘ නිවාසය සහ මිදිගම පොදු වෙළඳපොළ ගොඩනැගිලිවල වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) වටිනාකම රු.84,000 ක් වූ හානියට පත් කසළ කරත්ත 04 ක් ස්ථාවර වත්කම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවල පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ටැෆේ ට්‍රැක්ටරයේ හා ට්‍රේලර 02 ක වටිනාකම තක්සේරුකර ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඈ) දැන්වීම් පුවරු ගාස්තු ආදායම් වශයෙන් ලැබිය යුතු රු.162,600 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) කසළ ගාස්තු ආදායම් වශයෙන් ලැබිය යුතු රු.172,250 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) කර්මාන්ත 03 ක් වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන රු.55,600 ක් වැඩියෙන් සිදු කර තිබුණි.

(උ) එකතුව රු.60,213 ක් වූ තොග වටිනාකමක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඌ) වැලිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් 2006 නොවැම්බර් 27 දින වැලිගම ප්‍රාදේශීය සභාවට පවරා දී ඇති මිදිගම තුර්කි නිවාස ව්‍යාපෘතියේ වෙළඳ සංකීර්ණය සහ පොදු ගොඩනැගිල්ල හා තවත් ගොඩනැගිලි 03 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 අසම්භාව්‍ය බැරකම්**

----------------------

සභාවට අයත් තුර්කි කඩ කාමර වෙනුවෙන් ගෙවිය යුතු රු.1,249,476 ක විදුලි බිල සඳහා ප්‍රාදේශීය සභාවට එරෙහිව දිසා අධිකරණයෙහි පවරා තිබූ නඩුව පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.5,648,615 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.2,422,380 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

**(ආ)** ගෙවිය යුතු ගිණුම්

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.11,067,337 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.2,932,956 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.724,919 ක් වූ වැට්බදු තැන්පතු ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

----------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 84,165,745 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

### 1.3.5.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වගන්තිය | 1998 වර්ෂයේ සිට සිදු කර තිබුණු ඉදිකිරීම් වෙනුවෙන් වරිපනම් බදු ගෙවන 3585 කට අදාළව දේපළ තක්සේරු කර, නව තක්සේරු වටිනාකම් යටතේ වරිපනම් අය කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 196 | පාරිභෝගික භාණ්ඩ ලේඛනය වගකිව යුතු ලිපිකරුවකු භාරයේ තබා එක් එක් භාණ්ඩ නිකුත් කිරීම් සම්බන්ධ සම්පූර්ණ සටහනක් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 189 රෙගුලාසිය | රු.21,197 ක් වටිනා අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.63,645,269 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.56,379,299 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,590,500 | 5,496,311 | 5,362,681 | 1,302,663 | 4,816,500 | 3,835,071 | 3,744,438 | 1,169,033 |
| කුලී | 3,657,500 | 3,066,989 | 2,893,535 | 761,552 | 3,339,700 | 2,890,866 | 3,289,174 | 588,098 |
| බලපත්‍ර ගාස්තු | 4,175,500 | 7,809,196 | 6,312,196 | 1,551,150 | 4,128,000 | 6,813,390 | 6,843,890 | 54,150 |
| වෙනත් ආදායම් | 54,370,600 | 61,101,942 | 6,277,797 | 139,035,850 | 42,842,000 | 56,794,948 | 28,821,413 | 84,211,705 |
| -එකතුව- | 66,794,100 | 77,474,438 | 20,846,209 | 142,651,215 | 55,126,200 | 70,334,275 | 42,698,915 | 86,022,986 |

## 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු.66,794,100 ක් වූ අතර බිල්කළ ආදායම රු.77,474,438 ක් විය. රු.86,022,986 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.163,497,424 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.20,846,209 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.142,651,215 ක් වී තිබුණි.

## 2.2.3 වරිපනම් හා බදු

----------------

### (අ) වරිපනම්

----------

ආරම්භක හිඟය රු.1,039,112 ක් වූ අතර, රු.290,576 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.1,329,688 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.137,279 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.1,192,409 ක් හිඟව පැවතුණි.

### (ආ) අක්කර බදු

------------

ආරම්භක හිඟය රු.129,921 ක් වූ අතර, රු.11,075 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.140,996 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.30,742 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.110,254 ක් හිඟව පැවතුණි.

## 2.2.4 බදු කුලී

---------

ආරම්භක හිඟය රු.588,097 ක් වූ අතර, රු.3,088,149 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.3,676,246 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.2,914,695 ක් වීමෙන් වර්ෂය අවසානයට රු.761,551 ක් හිඟව පැවතුණි.

## 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.11,693,526 ක් හා මුද්දර ගාස්තු රු.125,216,034 ක් විය.

## 2.3 අධිභාර

--------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවලදී රු.7,750.286 ක වටිනාකමකට වූ අධිභාර 10 ක් පනවා තිබූ අතර එම අධිභාරවලින් රු.7,750,286 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයවී නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිලිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ප්‍රතිපාදන නොසැලසීම**

-------------------------

සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.2,049,014 ක් වූ කර්තව්‍යයන් 02 ක් සඳහා ප්‍රතිපාදන නොසැලසීම නිසා එම කර්මාන්ත ඉටුකර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

----------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) විවිධ කර්තව්‍යයන් 04 ක් ඉටු කිරීම සඳහා රු. 15,203,774ක මුදලක් වැයකර තිබුණද, අපේක්ෂිත නිමවුම් මට්ටම (output) අත්පත් කරගෙන නොතිබුණි.

(ii) මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ කර්තව්‍යයන් 04 ක් සඳහා රු.513,000 ක මුදලක් ලැබී තිබුණද, එම කර්මාන්ත ඉටුකර නොතිබුණි.

**(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම**

-------------------------------------------------------

ජාතික තරුණසේවා සභාවේ ප්‍රතිපාදන මත අදියර දෙකකට ඇස්තමේන්තු කර පළමු අදියරේ වැඩ සඳහා රු.1,049,844 ක් ගෙවා ඉදිකර තිබූ දිවාරාත්‍රී වොලිබෝල් ක්‍රීඩාපිටිය වසර 03 ක් ගතවී තිබුණද අදාළ කාර්යය සඳහා යොදවා ගෙන නොතිබුණි.

**(ඈ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---------------------------------------

කඹුරුගමුව ඉපිටමුල්ල මාර්ගය පුළුල් කිරීම සඳහා 2015 ජුනි මාසයේදී සභාවට ලබාදී තිබූ රු.8,609,646 ක මුදල අදාළ කර්මාන්තය ඉටු නොකර ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

**(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුළ කසළ එකතු කිරීම වෙනුවෙන් රු.11,556,604 ක් වැය කර තිබූ අතර, එකතු කරනු ලබන කසළ බල ප්‍රදේශයේ පෞද්ගලික ස්ථානවලට බැහැර කර තිබුණි.

(ii) සභාව සතුව තිබූ අක්කර 01 රූඩ් 01 පර්චස් 28 ක්වූ කරුවලබැද්ද නැමැති ඉඩම, කසළ ව්‍යාපෘතිය සඳහා කඹුරුගමුව කඩොලාන නමැති ඉඩමට රු.2,000,000 කට හුවමාරු කරගෙන තිබුණි. අදාළ භූමිය දුර්ලභ කඩොලාන සහිත පරිසරයක් වීම නිසා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර බලපත්‍රය ලබාදීම ප්‍රතික්ෂේප කර තිබූ බැවින් අදාළ ඉඩම් හුවමාරුවේ අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණ අතර, කසළ කළමනාකරණය සඳහා භූමියක්ද නොවීය.

**(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක**

---------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

සභා බල ප්‍රදේශයේ තුල සංචාරක නවාතැන් 344 ක් පැවතියද, කසළ බදු අය කිරීම හෝටල් 67 කින් පමණක් සිදු කර තිබූ බැවින් රු.225,500 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සේවක සංඛ්‍යා සැළැස්මේ අනුමත තනතුරුවල එක් පුරප්පාඩුවක් සහ සේවක අතිරික්තය 29 ක් විය

(ii) විධිමත් අනුමැතියකින් තොරව තාවකාලික /ආදේශක තනතුරු 03ක් සඳහා සේවකයින් බඳවාගෙන තිබුණි.

(iii) 2017 වර්ෂය තුළ මාර්ග කම්කරුවන් 04 ක් හා එක් සෞඛ්‍ය කම්කරුවෙක් අදාළ රාජකාරිවලින් බැහැරව කාර්යාලය තුල විවිධ රාජකාරිවල යොදවා වැටුප් ලෙස රු.2,079,048 ක මුදලක් ගෙවා තිබුණි.

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

### 3.4.1 වීථි පහන් නඩත්තුව

---------------------

සභාව විසින් වීථි පහන් නඩත්තුව වෙනුවෙන් රු. 828,310 ක මුදලක් වැය කර තිබූ අතර,වර්ෂය තුළ රු.734,287 ක වීථි පහන් උපකරණ මිලදී ගෙන තිබුණි. වීථි පහන් කණු අංක නොකිරීම නිසා වීථි පහන් යෙදවීම පිළිබඳ පරීක්ෂා කළ නොහැකි විය. සභා බල ප්‍රදේශයේ අනුමත වීථි පහන් සංඛ්‍යාවට වඩා වීථි පහන් කණු 247 ක් සවිකර තිබුණි.

### 3.4.2 දේපළ තක්සේරුව කාලානුරූපීව සිදු නොකිරීම

------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි ශේෂය තුළ ඇතුළත්ව ඇති අක්කර 08, පර්චස් 26.94 ක් වූ ඉඩම් කැබලි 51 ක් තක්සේරුකර, එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

----------------------------

**නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

සභාව සතු රු. 7,462,799 ක්වූ වාහන 03 ක් සහ යන්ත්‍ර 02 ක් වසර ගණනාවක සිට නිශ්ක්‍රීයව පවතින අතර 2015 ජූලි 10 දිනැති මුදල් චක්‍රලේඛ අංක 02/2015 පරිදි ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.6 ප්‍රසම්පාදනය

---------------

### 3.6.1 ප්‍රසම්පාදන සැළැස්ම

-----------------------

සභාව විසින් ඉටු කරනු ලබන සේවා සහ මිලදී ගැනීම්වලට අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

### 3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------

කර්මාන්ත 04 ට අදාළ කොන්ක්‍රීට් කුට්ටි ගල් 27 ක් පරීක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තු කර ගෙවීම් කර තිබුණද, කොන්ක්‍රීට් කුට්ටි ගල් 16 ක පරීක්ෂණ වාර්තා පමණක් සැළකිල්ලට ගෙන රු.3,528,914 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------.

### 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) වියදම් විෂයයන් 08 ක එකතුව රු.73,188,176 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම් සියයට 16 සිට 89 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.30,485,893 ක් වූ අතර, එම වටිනාකම් සියයට 16 සිට සියයට 66 දක්වා පරාසයක පැවතුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමඟ සාකච්ඡා කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 4.4 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

-------------------------------------

2015 වර්ෂයේදී අදාල ගැලපීම් නොකර සමුච්චිත අරමුදල් ගිණුමට ලියා හැර තිබූ රු.65,791 ක්වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) අයවැය පාලනය

(ඇ) ගිණුම්කරණය